**පොළොන්නරුව මහා නගර සභාව - 2023**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොළොන්නරුව මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ව මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහානගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු මැද පළාත් මහා නගර සභාවල මූල්‍ය පරිපාලන රීති අංක 97 අනුව මහා නගර සභාවක් පිළියෙල කළ අයවැයෙහි ඇතුළත් තොරතුරු ඊට අදාළ කාලච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා වත්කම් වගකීම් ප්‍රකාශනයේ අයවැයගත තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව මහනගර සභාවක මූල්‍ය ප්‍රකාශන සමඟ අයවැය ගත තොරතුරු ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂවේදී එසේ සිදු කර නොතිබුණි. | අයවැයගත තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතුය. |
| (ආ) | මූල්‍ය පරිපාලන රීති අංක 96 අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර ඇති මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පෙර වර්ෂයට අදාළ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | සංසන්දනය කිරීම සඳහා පූර්ව වර්ෂයට අදාළ තොරතුරු ඇතුළත් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව 2024 වර්ෂයේදී ගෙවීම් කරන ලද රු.5,711,655 ක වියදම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් යටතේ දක්වා නොතිබුණි. | පිළිගෙන ඇත. | උපචිත පදනම අනුව ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | පොළොන්නරුව රෝහල ඉදිරිපිට රථගාල වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල ආදායම රු.1,545,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.2,000,000 ක් ලෙස දැක්වීම නිසා ආදායම රු.455,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගෙන ඇත. | උපචිත පදනම අනුව ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 2021 වර්ෂයේදී මහා නගර සභා බල ප්‍රදේශයේ ඉදිකිරීම් ආරම්භ කර, වැඩ අවසන් නොකර අතහැර දමා තිබුණු විද්‍යුත් පුස්තකාල 04 ක් සඳහා වැයකර ඇති | එය නිවැරදි කිරීමට කටයුතු කරන බව | කෙරීගෙන යන වැඩ යටතේ නොනිමි වත්කම් දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.4,262,832 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කර නොතිබුණි. | | |
| (ඇ) | රු.1,842,418 ක් වූ මහා නගර සභාවට අයත් කිරි අලෙවි සැලේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගෙන ඇත. | සියළු වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදීද රු.125,400 වූ වීථි පහන් උපකරණ තොගයක් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගෙන ඇත. | තොගයෙහි වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් සෘණ මුදල් ප්‍රවාහයක් ලෙස දැක්විය යුතු ගෙවියයුතු දෑ වල අඩුවීම, රු.7,630,868 ක් ධන මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි කරන බව | ගැලපීම් නිවැරදිව සිදුකළ යුතුය. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිනි නිවීමේ වාහන කුලී හා කර්මාන්ත ණයගැති ශේෂවල රු.3,559,862 ක වටිනාකම ඒවාට අදාළ උපයෝගී ලේඛන අනුව නොසැසඳුණි. | මූල්‍ය ප්‍රකාශන ශේෂය හා එල්.ජී.06 උප ලේඛනය අනුව ඉදිරිපත් කළ බව දන්වා ඇත. | ගිණුම් පොත්පත් සැසඳීම් කර නිවැරදි අගයන් දැක්විය යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>-------------- | | | |
| (i) | මුදල් රෙගුලාසි අංක 395(ඇ) | සමාලෝචිත වර්ෂයේ එක් බැංකු ගිණුමකට අදාළව බැංකු සැසඳුම් පිළියෙල කිරීම මාස 01 සිට මාස 10 දක්වා ප්‍රමාද වී තිබුණි. | කාර්ය මණ්ඩල හිඟතාව ප්‍රමාද වී ඇති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 396 (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ කාලය මාස 06 ඉක්මවා තිබුණු එකතු වටිනාකම රු.458,988 ක් වූ චෙක්පත් 33 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ අයභාරය රු.712,753 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්ම වූ වියදම රු.29,640,178 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ඉදිරිපත් වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 26,733,000 | 26,733,000 | 20,418,712 | 37,049,975 | 28,984,000 | 28,984,000 | 26,338,179 | 30,735,687 |
| (ii) | කුලී | 114,628,000 | 114,628,000 | 97,243,281 | 91,116,872 | 84,343,000 | 84,343,000 | 59,173,832 | 73,732,153 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,600,000 | 6,600,000 | 6,600,000 | - | 6,100,000 | 6,100,000 | 3,946,004 | |
| (iv) | වෙනත් ආදායම් | 75,816,000 | 75,816,000 | 64,964,967 | 15,937,033 | 63,446,000 | 63,446,000 | 18,093,574 | 5,086,000 |
| | | 223,777,000 | 223,777,000 | 189,226,960 | 144,103,880 | 182,873,000 | 182,873,000 | 107,551,589 | 109,553,840 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු ආදායම රු.57,468,581 ක් හා හිඟහිටි වරිපනම් ආදායම | මෙම මුදල් අයකර ගැනීම සඳහා රතු නිවේදන නිකුත් කරමින් පවතින අතර එසේ නොගෙවන්නන් සඳහා මහා | නියමිත පරිදි ආදායම් රැස්කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.37,049,574 ක් වූයෙන් ආදායමින් සියයට 64 ක ප්‍රතිශතයක් හිඟ ආදායම් ලෙස පැවතුණි. | නගර සභා ආඥා පනතේ 252 වගන්තිය අනුව විනිශ්‍රහන බලපත්‍ර ඉදිරිපත් කරන බව | |
| **(ආ)** | **කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා රැස්කළ යුතු ආදායම රු.188,360,153 ක ආදායමින් වර්ෂයේදී රැස්කර තිබූ ආදායම රු.97,243,281 ක් එනම් සියයට 51 ක ප්‍රතිශතයක් වී තිබුණි. | පොළොන්නරුව මහා නගර සභාවට අයත් කඩ කාමර 2020වර්ෂයේ ජනවාරි සිට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කරන ලද තක්සේරු හේතුවෙන් කඩකුලී වැඩිවූ බැවින් කඩහිමියන් හට ගෙවීමට නොහැකි වූ අතර එම කඩකුලී කොටස් වශයෙන් ගෙවීමෙන් පවතින බවත්,<br>පොළොන්නරුව වෙළඳ සංකීර්ණය සම්බන්ධව පවත්වන පරීක්ෂණයෙන් පසු එම කමිටු තීරණ මත කඩ කුලී අයකිරීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | නියමිත පරිදි ආදායම් රැස්කළ යුතුය. |
| (ii) | මහා නගර සභාවට අයත් කඩකාමර 149 කට අදාළ රු.16,238,205 ක හිඟයක් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරන බව | නියමිත පරිදි ආදායම් රැස්කළ යුතුය. |
| (iii) | වත්කම් බදුදීම් වලට අදාලව දීර්ඝ කාලීනව අය නොවන රු 4,213,112. ක හිඟයක් 2023දෙසැම්බර් 31දින වන විටත් නිරවුල් නොවී පැවතුණි. | පවතින හිඟ අයකිරීමට කටයුතු බව | නියමිත පරිදි හිඟ ආදායම් රැස්කළ යුතුය. |
| **(ඇ)** | **වෙනත් ආදායම්** | | |
| | මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට හිඟ කසළ ගාස්තු රු.10,943,500 ක් නිරවුල් කරගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | සත්‍ය වශයෙන්ම කසළ ලබා දෙනු ලබන ආයතන පිළිබඳව සොයා බලා මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ නිර්දේශය සහිතව පරිපාලන කමිටු අනුමැතියකින් නිවැරදි කිරීම් සිදු කර ගැනීමට කටයුතු යොදා ඇති බව | කසළ බදු ආදායම් සඳහා බිල්කිරීම කසළ එකතු කිරීමේ සේවය අනුව සිදුවිය යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කායර්සාධනය

මහා නගර සභා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන මහා නගර සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **<u>අත්හැර දැමූ කතර්ව්‍යයන්</u>**<br>රු.4,262,832 ක් වැයකර ඉදිකර තිබුණ විද්‍යුත් පුස්තකාල 04 ක 2024 මැයි වන විටත් එයින් අපේක්ෂිත ප්‍රතිඵල ලබානොගෙන අත්හැර දමා තිබුණි. | වැඩ කොටස් නිම කිරීමට 2024 වර්ෂයේ අයවැයට ඇතුළත් කරන බව | ස්ථාපිත වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොළොන්නරුව මහා නගර සභාවේ ඉඩම් වල සවිකර ඇති දුරකථන කුළුණු වලට අදාළව ලැබිය යුතු බිම් කුලියෙන් රු.2,038,483 ක කුලියක් හිඟව පැවතුණු අතර, ඒවා සම්බන්ධ ගිවිසුම් යාවත්කාලීන කර නියාමන කටයුතු සිදුකර නොතිබුණි . | ගිවිසුම් සකස් කර ඇති අතර යාවත්කාලීන කිරීමටත් හිඟ මුදල් අය කිරීමටත් කටයුතු කරන බව | කඩිනමින් හිඟ මුදල් අයකළ යුතු අතර ගිවිසුම් යාවත්කාලීන කර නියාමනයන්ද සිදුකළ යුතුය. |
| (ආ) | පොළොන්නරුව නව වෙළඳ සංකීර්ණය (PCC) පිටුපස බදුදිය හැකි කඩ කාමර 41 න් කඩකාමර 31 ක් ගිවිසුම් මගින් ලබාදී ඇති අතර ඉතිරි කඩ කාමර 10 බදුදීමක් ද සිදුකර නොතිබුණු බැවින් 2021 වර්ෂයේ ජූලි මස සිට විගණිත දින වන 2024 පෙබරවාරි දක්වා සභාවට අහිමි වී ඇති ආදායම ආසන්න වශයෙන් රු.6,200,000 ක් පමණ විය. | කඩ කාමර බදු දීමට කටයුතු කරමින් පවතින බව. | පවතින වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයේ බදුදී ඇති පොළොන්නරුව මහා නගර සභාවේ නව පොදු වෙළඳ සංකීර්ණයේ කඩකාමර 57 ක් සඳහා හිඟ බදු කුලිය රු.52,918,053 ක් වූ අතර, මෙම කඩ කාමර 57 න් කඩකාමර 06 ක් 2024 පෙබරවාරි මස මුද්‍රා තබා ඇතත් ඉතිරි කඩකාමර 51 සම්බන්ධයෙන් ගිවිසුමේ වගන්ති 20 හා 22 අනුව කටයුතු කර නොතිබුණි. | සිදු කරගෙන යන විමර්ශනයෙන් පසු ලබා දෙන තීරණ මත ඉදිරි කටයුතු ඉටු කරන බව | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | පොළොන්නරුව මහා නගර සභාවට අයත් පොදු වෙළඳ සංකීර්ණය ,බස් නැවතුම්පොළ කඩකාමර හා රෝහල හංදිය කඩකාමර සඳහා සභාව වෙත ලැබිය යුතු රු15.,964,890 ක එක්වන් මුදල (key money) අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කාලීනව පවතින මෙම හිඟ මුදල් වාරික ගෙවීම් කරන බවත් ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරන බව | නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2024 ජනවාරි මස බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2020 සැප්තැම්බර් 30 දින සිට 2023 දෙසැම්බර් 14 දින දක්වා අවස්ථා 60 කදී බැංකු ගිණුම වෙත සෘජු ප්‍රේෂණ ලෙස ලැබී ඇති රු.2,110,470 ක් හඳුනා නොගත් ලැබීම් නිරවුල් කර නොතිබුණි. | හඳුනා නොගත් ලැබීම් හඳුනා ගැනීමට බැංකු සහය ඉල්ලා ලිපි ඉදිරිපත් කර ඇති බව | සෘජු ප්‍රේෂණ කඩිනමින් හඳුනාගෙන ආදායම් ශීර්ෂයන්ට බැර කළ යුතුය. |
| (ඊ) | 2022 වර්ෂයේ ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ලබාදුන් රු.926,600 ක ප්‍රතිපාදන අදාල කාර්යයන්ට යෙදවීමකින් තොරව විවිධ තැන්පත් යටතේ දක්වා තිබුණි. | සොයා බලා ඉදිරි කටයුතු සිදු කරන බව | ලැබෙන ප්‍රතිපාදන අදාළ කාර්යන්ට යෙදවිය යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 4 ඇල ක්‍රීඩාංගනය අසල කිරිහලේ 2022 අගෝස්තු 17 දිනැති ගිවිසුමේ බදු ගිවිසුම්කරු සභාවේ මන්ත්‍රීවරයෙකුගේ ඥාති පුත්‍රයෙකු බව හා වෙළඳසැල එම මන්ත්‍රීවරයා විසින් පවත්වගෙන යන බවත් නිරීක්ෂණය විය. කිරිහල ඉදිකර ගැනීම සඳහා රු.1,842,418 ක් වූ වර්ග අඩි 247 ක ගොඩනැගිල්ලක් සඳහා ඉදිකිරීම් සැලැස්මක් සභාව විසින් ලබාදී තිබූ අතර, එම සැලසුම අනුව ඉදිකිරීම් සිදුනොකර සැලසුමේ ඇතුළත් නොවූ අනවසර ඉදිකිරීම්ද සිදුකර තිබුණි. මෙම කිරිහල සඳහා මාසික බිම් කුලිය රු.2,000 ක තාවකාලික තක්සේරුවක් මත ගාස්තු අයකිරීම හේතුවෙන් තක්සේරු වටිනාකමින් සියයට 20 ක මුදලක් අයකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු.96,000 ක පමණ වටිනාකමක් සභාව වෙත අහිමි වී තිබුණු අතර, මෙය සම්බන්ධිත පාර්ශව අතර සිදුවූ නීත්‍යානුකූල නොවන ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය වේ. | මෙම කිරිහල ගිවිසුම් ගතවන අවස්ථාවේදී ගිවිසුම්කරු සභිකවරුන්ගේ හෝ කාර්ය මණ්ඩල කිසිවෙකුගේ ඥාතිවරයෙකු නොවන බව පෙනී යන ලදි.අනුමත සැලැස්මකට අනුව ඉදිකළ යුතු බවට මහා සභා තීරණයක් ගෙන තිබුණද,එම සැලැස්ම අනුමත කර නොගැනීම හේතුවෙන්,ඉදිකරන ලද සැලැස්ම අනුමත කර ගන්නා ලෙස ලිඛිතව දැනුම් දී ඇත.තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මාසික කුලිය රු.10,000.00ක් ලෙස තක්සේරු කර ඇති අතර 2024 ජනවාරි සිට මෙම මුදල අය වෙමින් පවතින බව | මහා නගර සභා සේවකයින් හෝ නාගරික මන්ත්‍රීන් සමඟ නියමින් හෝ අනියමින් ගිවිසුම් සම්බන්ධතා ඇතිකරගත නොහැකි බැවින් නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය. |

## 3.4 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.12,054,532 ක් වූ මහා නගර සභාව සතු ගොඩනැගිලි 02 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | කඳුරුවෙල දමන කැලේ නිල නිවාසය අළුත්වැඩියා කර ඇති අතර අවශ්‍යතාව මත ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමි. පැරණි පොළ භූමිය කඩ කාමර හිමිකම තහවුරු කළ අය වෙත ලබා දුන් අතර | සියළු වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | හිමිකම සම්බන්ධව ගැටළුකාරි තත්වයක් උද්ගතව පැවති කඩ කාමර එම අවස්ථාවේදී ලබා දීමට නොහැකි විය.මේවන විට එම කඩ කාමර වල හිමිකම් තහවුරු කර ගෙන ඇති අතර කඩ කාමර ලබා දීමට කටයුතු කරමින් පවතින බව |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මහා නගර සභාවේ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ පරික්ෂාවේදී සියයට 35 සිට 683 දක්වා පරාසයක විචලනයක් පැවතුණි. | ආර්ථික, දේශපාලනික, සමාජීය විචලනයන් හේතුවෙන් බව දන්වා ඇත. | අයවැ ය මූල්‍ය මහපෙන්වීමක් ලෙස භාවිතා කළ යුතුය. |

### 4.2 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා අලුතින් හඳුනාගත් පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 18 ක් සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගැනීම සම්බන්ධව පරිසර බලපත්‍ර ලබා නොගන්නා අයවලුන් පිළිබඳව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව | පරිසර බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය විධිමත් කළ යුතුය. |